# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2265/12 – 2022 ජනවාරි මස 31 වැනි සඳුදා – 2022.01.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2002 අප්‍රේල් මස 23 වැනි දින අංක 1233/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2002 අංක 49 දරන ආඥාවේ ඇතුලත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත 1 වැනි උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,<br>ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 13/99/ HW/113.<br>
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: RDA/LA/98/44.<br>
2022 ජනවාරි මස 15 වැනි දින,<br>
ඉඩම් අමාත්‍යාංශය,<br>
'මිහිකත මැදුර',<br>
අංක 1200/6, රජමල්වත්ත පටුමග,<br>
බත්තරමුල්ල.

1 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිඹිරිගස්යාය කොට්ඨාස අංක 40 තිඹිරිගස්යාය, කොට්ඨාස අංක 41 කිරුළ කොළඹ මහනගර සභා සීමාව තුළ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූ.පි.කො. 8708 හා 2014.05.17 දිනැති මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 227 – වරි. අංක 364, තිඹිරිගස්යාය පාර – ප්‍රමාණය: හෙක්. 0.0348**

උතුරට: සුනේත්‍රා වීදිය සහ කැබලි අංක 226; නැගෙනහිරට: වරි. අංක 364 තිඹිරිගස්යාය පාර සහ සුනේත්‍රා වීදිය; දකුණට: වරි. අංක 364, 314, තිඹිරිගස්යාය සහ කැබලි අංක 228; බටහිරට: කැබලි අංක 228, 229 සහ 226.

EOG01 - 0334


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*